


# පිළිකුල් වශයෙන් කය දකිමින් ....

සාර්ථක භාවනාවක් සඳහා අවශ්‍ය මූලික දැනුම සොයා ගිය මට ධාතු හතරට අමතර ව උපාදාය රූප පිළිබඳව ද කියවන්නට අසන්නට ලැබිණි. ඒ දන්කන්දේ ධම්මරතන හිමියන්ගෙනි.

උන් වහන්සේ මෙසේ කී හ.
"මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ මූල ධාතු හතරට අමතරව, බුදු රජාණන් වහන්සේ දක්වනවා සතර මහා භූත නිසා හටගත් උපාදාය රූප. උපාදාය රූප කියන්නේ මහා භූත නිසා හටගත් රූප කොටස් කියන එක යි.

"අපේ ඇසේ තියෙනවා ප්‍රසාද ගතියක් ; යම්කිසි ඔප මට්ටම් ගතියක්. ඇසේ තිබෙන ප්‍රසාද ගතියට කියනවා චක්ඛු ප්‍රසාද රූපය කියලා. මේක මූල ධාතු හතර නිසා හැදිච්ච උපාදාය රූපයක්.

"කනෙත් තිබෙනවා ශබ්ධ තරංග ගිහිල්ලා වැදෙන ස්ථානයේ යම්කිසි ප්‍රසාද ගතියක්. ඕකට කියන්නේ සෝත ප්‍රසාද රූපය කියලා. ඒකත් උපාදාය රූපයක්.

"නාසයෙත් තියෙනවා ගඳ සුවඳ දැනගැනීමට හැකි වන සේ හැදුණ ප්‍රසාද ගතියක්. ඒ ඝාන ප්‍රසාද රූපයත් උපාදාය රූපයක්.

"දිවෙත් තිබෙනවා ප්‍රසාද ගතියක්. ජිව්හා ප්‍රසාද රූපය. ඒ වගේ ම කය පුරාමත්, වියළි හම, නියපොතු, කෙස් වගේ තැන් හැර අනෙක් තැන්වල තිබෙනවා ප්‍රසාද ගතියක්. ශරීරය ඇතුළේ තිබෙන මස් ආදි කොටස්වලත් ප්‍රසාද රූප ගතියක් තිබෙනවා. ඒවාට කියන්නේ කාය ප්‍රසාද රූප කියලා. මේවා සතර මහා භූත නිසා ඇති වෙච්ච උපාදාය රූප.

"බොහෝ දෙනෙක් බොහෝවිට රැවටෙන්නේ මේ සමේ තිබෙන ප්‍රසාද ගතියට; ඔප මට්ටම් ගතියට. තැඹිලි ගෙඩියක මතුපිට පොත්ත වගේ, නැත් නම් කෙසෙල් ගසක ඉහළ පතුරු ගැලව්වා ම ඇතුළතින් ඇති සිනිඳු ඒවා වගේ, මේ සමේ තිබෙන ප්‍රසාද ගතියට බොහෝ අය රැවටෙනවා.

"මේක මොකක්ද කියලා තේරුම් ගන්න. මූල ධාතු හතරක් තියෙනවා. මූල ධාතු හතරේ ස්වරූපය තමයි බොහෝවිට මතුපිට පෘෂ්ඨය ඒ විධියට ඔපමට්ටම් වෙලා පැවතීම. මලක්, ගෙඩියක් වගේ බොහෝ දේවල මතුපිට පෘෂ්ඨය සිනිඳුයි. ඔබමට්ටම්, අපේ හමේ ඇති සිනිඳු භාවයත් ප්‍රසාද රූපයක් හැර වෙන දෙයක් නොවෙයි. ඇත්තෙන් ම මෙතන තියෙන්නේ මූල ධාතු හතරක එකතුවක් නිසා ඇති වෙච්ච උපාදාය රූපයක්. මේකට තමයි මේ රැවටෙන්නේ කියන අවබෝධය ඇති කරගන්න.

" මෙම ප්‍රසාද රූප වලට අමතරව, මේ ශරීරය පුරා ම තිබෙනවා ස්ත්‍රියක් නම් ස්ත්‍රී භාව රූප, පුරුෂයෙක් නම් පුරුෂ භාව රූප, නපුංසක වැනි අයගේ ශරීර වල මේවායේ වෙනස්කම් තිබෙන්නට පුළුවනි. ස්ත්‍රියක් ය, පුරුෂයෙක් ය කියලා රැවටුණේ සතර මහා භූත නිසා හටගත් මේ ස්ත්‍රී භාව, පුරුෂ භාව රූපවලට නේද කියලා අවබෝධ කරගන්නට බලන්න."
"මේ ශරීරයේ තිබෙනවා වර්ණයක්. අපි සුදු පාටයි. කළු පාට යි, ලස්සන යි, කැත යි ආදී වශයෙන් කියන වර්ණයක් තියෙනවා. මේ වර්ණය සතර මහා භූත සංයෝගයෙන් හැදුණු උපාදාය රූපයක්. අපි යම්කිසි වර්ණයක් දකිනවා නම් මේක සතර මහා භූත නිසා ඇති වෙච්ච උපාදාය රූපයක් කියලා අවබෝධ කරගත යුතුයි. ඒ හැර වෙන දෙයක් එහි නැහැ. අපි මේ වර්ණයට රැවටුණා කියන්නේ මූල ධාතු හතරට රැවටුණා කියන එක යි.

"මේ ශරීරයේ දුඟදක් තිබෙනවා. මේ ගන්ධය කියන්නේ උපාදාය රූපයක්. මූල ධාතු වලින් හැදිච්ච එකක්.

" මේ වගේම මේ ශරීරයේ යම්කිසි රසයක්, ඕජාවක් තිබෙනවා. සමහර විට මේ ශරීරය ඕලාරික වෙලා යන ස්වරූපයක්. සමහර විට සියුම් වෙලා ප්‍රබෝධවත් වෙලා යන ස්වරූපයක් මේ ශරීරයේ තියෙනවා. තරහ ගිය වෙලාවක මුහුණ රළු වන ගතියයි. සතුටින් මෛත්‍රී සහගත සිතින් සිටින අවස්ථාවල ඇති වන ප්‍රබෝධවත් පැහැපත් ස්වරූපයයි අතර ලොකු වෙනසක් තිබෙන්නේ. මෙලෙසින් මේ ශරීරයේ ඇති මෘදු භාවය, එලෙසින් ම මෙම ශරීරය ක්‍රියාත්මක කරන්නට පුළුවන් කර්මණ්‍ය භාවය ආදී මේ ඔක්කෝම මූල ධාතු හතර නිසා හටගත් උපාදාය රූප.

"මේ උපාදාය රූප අවබෝධ කරගැනීම ඉතාමත් අවශ්‍ය යි. මොක ද, මේ රූපයට තමයි බොහෝ දෙනෙක් ආශා කරන්නේ. මේ රූපය තමයි බොහෝ දෙනෙක් උපාදාන කරන්නේ. මේ රූපයමයි බොහෝ දෙනෙක් සංසාර ගමන දිග්ගස්සාගැනීමට හේතු කරගන්නේ, මේ නිසා මේ රූපයේ යථා තත්ත්වය හොඳින් අවබෝධ කරගත යුතුයි. "

ධාතු හතර සහ උපාදාය රූප පිළිබඳ අවබෝධය මෙන් ම ශරීරය යථා ස්වරූපය පිළිබඳ දැනුම ද භාවනාවක් සාර්ථක ව කිරීමට අවශ්‍ය බව අපේ ලොකු හාමුදුරුවන් කියනවා. උන් වහන්සේ ඒ දැනුම සඳහා ද මා යොමු කළේ දන්කන්දේ ධම්මරතන හාමුදුරුවන්ගේ දේශනා දෙසට.

ඒ දේශනා වල මෙසේ කියවෙනවා.
"රූපයේ තවත් ස්වරූපයක් තමයි ඒක කුණපු කොටස් තිස්දෙකකින් සමන්විත වීම. මතුපිට සමේ ඔපමට්ටම් ගතියක් තිබෙන බව මා කලින් කීවා. සම ඇතුළේ තිබෙන කොටස් එකක් වත් ඔපමට්ටම් වත්, පිරිසිදු දෙයක් වත්, දකින්නට ප්‍රිය වෙයක් වත්, සිපගන්නට සුවඳවත් දෙයක්වත් නොවෙයි. සෑම කොටසක් ම අපිරිසිදුයි. සෑම කොටසක් ම දකින්නටත් අප්‍රියයි. සෑම කොටසක් ම දුඟදයි. ශරීරය පුරා ම ලේ තිබෙනවා. ලේ ඉතා දුඟදයි. ශරීරයේ විශේෂයෙන් ම මහත තැන්වල මේද තට්ටු තිබෙනවා. ඒ සෑම මේද කොටසක් ම බිත්තර ගඳ සේ පිළිගඳ හමන ගතියක් තිබෙනවා. මේ විධියට ශරීරයේ පිළිකුල් කොටස් තිස්දෙකක් තිබෙනවා. ඒවා තමන් අවබෝධ කරගන්නට ඕනෑ. මේ ශරීරය මහා දුඟද දෙයක්. අපවිත්‍ර දෙයක්. ඒ වගේ ම දකින්නට අප්‍රිය වූ ජුගුප්සාජනක වූ දෙයක් කියලා අවබෝධ කරගත යුතුයි.
"බුදු රජාණන් වහන්සේ මෙසේ දේශනා කොට තිබෙනවා.

"මහණෙනි, කුණු වූ තුවාලයක් ( ගඩුවක් ) කියන්නේ මවුපිය සම්භවයෙන් ජනිත වූ, සතර මහා භූතයන්ගෙන් සෑදුණු, බත් එළවළු ආදිය නිසා පවතින, ආලේප කිරීම්ල පිරිමැදීම් ආදිය කළ යුතු, අනිත්‍යයට යන, කැඩී බිඳී විනාශ වන මේ කනට කියන වෙනත් වදනයක්,

"එහි තිබෙනවා මහණෙනි, තුවාල මුඛ නවයක්. මේ ශරීරයෙන් යම් දෙයක් වැගිරෙනවා නම් වැගිරෙන්නේ ම ජරාවක්; වැගිරෙන්නේම දුඟද හමන දෙයක්; වැගිරෙන්නේ ම පිළිකුල් අපවිත්‍ර දෙයක්. "
"මේක තේරුම් ගන්නට ඕනෑ. මේ කුණප කොටස් වැගිරෙනවා, ගලනවා නේද කියලා තමන්ගේ හිතට පේන්නට ඕනෑ. මෙහෙම අසූචි වැගිරෙනවා, මෙහෙම මුත්‍රා ගලනවා, මුළු ශරීරය පුරාම දහඩිය ගලනවා, මෙහෙම කබ කඳුළු ගලනවා. දහඩිය නොවන තෙල් වැනි ජරාවක් මෙහෙම සමෙන් වැගිරෙනවා කියලා මුළු ශරීරයෙන්ම මේවා වැගිරෙන ආකාරය දකිනවා. මේ ඔක්කෝම එක වර වැගිරෙන හැටි දකින්නට පුළුවන් නම් බොහෝම හොඳයි. මේවා සෝදන්නේ පවිත්‍ර කරන්නේ නැති ව ඒවා පිට වෙන්නට ඇරලා එහෙම ම හිටියොත් එහෙම මැස්සන්ට හැර වෙන කෙනෙකුට කිට්ටු වෙන්නවත් බැරි තරම් පරම දුර්ගන්ධ තත්ත්වයකට මේක පත් වෙන හැටි දකින්න. මේකෙන් පිට වෙන කොටස් යම් සේ දුඟද ද, ඊටත් වඩා ඒවා මේ ශරීරය ඇතුළේ තිබෙන විට දුඟදයි.

මේ පිළිබඳ ව කෑල ගහක උපමාවක් පොත්වල දක්වලා තිබෙනවා. කෑල කියලා ගස් ජාතියක් තිබෙනවා. රතුපාට මල් ගහ පිරෙන්නම පිපිලා තියෙනවා. ඉතින් නරි ගිහිල්ලා බලාගෙන ඉන්නවලු මේ ගහ උඩ තියෙන්නේ මස් කියලා. මස් තමයි නරියා දකින්නේ, 'ඔන්න මල් ටිකක් වැටෙනවා.' නරියා දුවගෙන යනවා. එතනට ගියහම, ආ මේ මල් නේ, මේ වැටුණේ නම් මල්. ඒත් ගස උඩ තියෙන්නේ මස්, කියන සංඥාවෙන් ඒ නරි දිගටම බලාගෙන ඉන්නවා.

මේ වගේම ශරීරය ඇතුළතින් පිට වෙනවා පරම දුර්ගන්ධ අසූචි, මුත්‍ර, කුණුකෙළ, දහඩිය ආදිය.වැටුණේ නම් මේ වගේ දුඟද හමන දේවල් තමයි. එහෙත් ඇතුළේ තියෙන්නේ ආශා කරන, ප්‍රිය කරන, ලස්සන හොඳ දේවල් තමයි. මෙහෙම තමයි සාමාන්‍ය ලෝකයා හිතන්නේ. ඒ නිසා ඒ තත්ත්වයට පත් වන්නේ නැති ව මේ කරුණු අවබෝධ කරගන්න, කය කෙරෙහි තිබෙන රාගය නැති කර ගැනීම සඳහා විරාගය ඇති කරගන්නට ඕනෑ. නැත්නම් නිවන් ලැබීමට අපහසු වෙනවා. ඒ නිසා ශරීරය පිළිකුල් වශයෙන් දකින්නට ඕනෑ.

